සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
# General Certificate of Education (Adv. Level) Examination, 2020

| | |
|---|---|
| සිංහල | I |
| சிங்களம் | I |
| Sinhala | I |

**71 S I**

| | | |
|---|---|---|
| පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* | අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| | மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| | Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

***උපදෙස්:***
✳ **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) 'පුතඬ, එසේ සිතන්නේ හැයි ද? මුඹ වර්ධන ව සිටියවුන් හෙයින් ගෙයි තබාගෙන හිඳුමෝ ද? ජාති ආදීන් සරි සාමාන්‍ය තැනකට පාවාදියහැක්කැ'යි කිවුය. 'අපට අනික් කවුරුනුත් නොකැමැත්තේ මුන් නොලදොත් මියමී' කිවුය. මෑණියෝ නොයෙක් ලෙස කියාත් ගිවිස්වාගත නොහී පියාණන්ට කිවුය. උයිත් කියා ගිවිස්වාගත නොහී කළමනා කිම් දෝහෝ යි සිතා ඒ සොරු මරන්ට ගෙනයන තැනැත්තවුන්ට මසු දහසක් සොරා යවා 'තෙලෙ හැරගෙන තුලූ නොමරා අපට එවුවමැනවැ'යි කියා යවූය. එයිත් ගිවිස උෟ සිටාණන්ට හැරලා අනිකකු මරාපියා 'සොරු මරාපීම්හ'යි රජ්ජුරුවන්ට කිවුය. සිටාණෝත් තමන්ගේ දුවණියන් **අර්ථී ව** උෟ ම කැමති හෙයින් මරණින් ගැලවුණු තැනැත්තවුට සරණපාවා දුන්හ.

(i) සොරා මරන්නට ගෙන යන්නවුන්ට මසු දහසක් දෙන ලද්දේ කවුරුන් විසින් ද?

(ii) මසු දහසක් ලබා දීමෙන් අපේක්ෂා කළේ කුමක් ද?

(iii) "තෙලෙ හැරගෙන තුලූ නොමරා අපට එවුවමැනවැ" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**අර්ථී ව**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ආ) "වෛද්‍යශිල්පය හදාරා ගතිම් නම් වෛද්‍යාචාරිය යන නම ඇසූ කල ම සත්ත්වයෝ මවුන් පියන් ගුරුන් කොට ම සිතා ඔවුන් කෙරෙහි ප්‍රිය ඇති වන්නාහුය. වෛද්‍යශාස්ත්‍රය නම් දතුවාහට මෙලොවත් වැඩ වෙයි. පරලොවත් වැඩ වෙයි. පින් වෙයි. එසේ හෙයින් වෛද්‍යශාස්ත්‍රය ම උගන්මි"යි සිතා තක්සලා නුවර ගොස් දිසාපාමොක් ආචාරීන් දැක තමන් ආ පවත් කියා සිටියහ. ආචාරි "තෙපි කවුරු දැ"යි විචාළහ. "අනිකක් කීම් නම් මා කෙරෙහි ආදර නොකරති"යි සිතා "රජගහ නුවර බිම්බිසාර රජ්ජුරුවන්ගේ මුනුබුරාණෙමි. අභය නම් රාජකුමාරයන් පුතණුයෙමි"යි කීහ. "කුමන ශාස්ත්‍රයක් උගනුදැ"යි විචාළහ. "වෛද්‍යශාස්ත්‍රය උගනිමි"යි කීහ. ආචාරීහු "ආචාරිභාගය ගෙනාවු දැ"යි විචාළහ. "දෙමවුපියන්ට නොකියා ශිල්පලෝභයෙන් **සොරා අයිමි**. එසේ හෙයින් ආචාරිභාගය නොගෙනායෙමි. නුඹවහන්සේට මෙහෙ කොට ධර්මාන්තේවාසිකව ශිල්ප හදාරමි"යි කීහ.

(i) වෛද්‍ය ශිල්පය හැදෑරීමෙන් ලැබෙන ඵල **දෙකක්** ලියන්න.

(ii) ශිල්ප ඉගැන්වීම සඳහා දිසාපාමොක් ආචාර්යවරයා ශිෂ්‍යයන්ගෙන් අපේක්ෂා කළේ කුමක් ද?

(iii) "නුඹවහන්සේට මෙහෙ කොට ධර්මාන්තේවාසිකව ශිල්ප හදාරමි." මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**සොරා අයිමි**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

(ඉ) එසඳ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනා ශබ්දය අසා පියසන් නොඇසෙන සේ සෙමෙන් සෙමෙන් අවුදින් ලියකිඳුරාණන් උන් තියාව ද නටමින් සිටි කිඳුරාඞ්ගනාවන් ද දැක පිළිබඳ වූ සිත් ඇති ව "මේ කිඳුරා විද දිවි තොර කොට මැ හා සමඟ වාසය කෙළෙම් නම් යහපතැ" යි සිතා සැඟවී සිට කිඳුරාට හීයක් විද්දේය. ඒ ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලේ දියෙන් මහත් වේදනාවෙන් මඬනා ලදුව හඬන්නේය. "සබඳ චන්ද්‍රිකාව මේ මාගේ ජීවිතය තව ද ආයු ඇති ව තිබිය දී සන්තතිවිච්ඡේදයෙන් නැසෙමි යි සිතමි. එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නොඇලෙමි. ලද ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලෙහෙයෙන් රැඳී ඔත්තා වූ හා මාගේ ජීවිතය නොබෝ කලකින් කඳ සැඟවෙන්නේය. කකියා ගිය තලතෙලක ලූ තණ සෙයින් ද මුලින් සිඳ හෙලූ ගසක් සෙයින් ද නියං සමයෙහි පැන් සිඳී වියලී ගිය මළ **හෝකඳුරක්** සෙයින් ජීවිත විනාශයට පැමිණෙන සේ බලව." පර්වතයක්හි වසන ලදුව ක්ෂණ ක්ෂණයෙහි වැහෙන්නා වූ වර්ෂා ජල ධාරාවක් සෙයින්ද කඳුළු වැහෙන්නට පටන් ගත්තේය.

(i) බරණැස් රජු කිඳුරාගේ දිවි තොර කිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(ii) කිඳුරා ක්‍රීඩා විනෝදයෙහි ඇලීම ප්‍රතික්ෂේප කළේ ඇයි?

(iii) "පියසන් නොඇසෙන සේ සෙමෙන් සෙමෙන් අවුදින්" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**හෝකඳුරක්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ඊ) ඒ කුමාරිකාවන්ගේ මෑණියෝ අවුත් තමන් දියණියන් මලස්න ශුද්ධ නොකොට මල් පිදූ බව දැක "එම්බල චණ්ඩාල කෙල්ල, අත්‍යන්ත නිර්මල වූ බුදුරජාණන් වහන්සේට මලස්න නොසෝධා කුමක් පිණිස මල් පිදී ද; තී කෙළේ කටයුත්තෙක් නොවේ"යි කීහ. ඒ අසා කුමාරිකාවෝ මෑණියන්ට කිපී "චණ්ඩාලකෙලි නම් තෙපි ම යැ"යි කියා තමන් මෑණියන්ට බිණූහ. මෙසේ ඒ කුමාරිකාවෝ මෙපමණ කුසල් අකුසල් කොට මැතභාගයෙහි එයින් චුත ව දඹදිව උත්තර මධුරා නම් නුවර වීණා ගායනා කරන එක්තරා චණ්ඩාල බ්‍රාහ්මණයක්හට දූව උපන්හ; එකල්හි පළමු කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් විශිෂ්ට වූ රූ ඇති වූහ; ඔවුන්ගේ **සියලඟින්** විදුලිය කළඹක් වැනි රශ්මි මාලා සමූහයෝ නික්මෙති; හාත්පසින් සතර රියන් පමණ තන්හි ශරීරාලෝකයෙන් ම අන්ධකාර දුරු ව එකාලොක වෙයි; මුඛයෙන් මහනෙල්මල් සුවඳ හමා බස්සී; ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වෙයි; ඔවුන් දෙතන මැද රන්වන් වූ තිලකාභරණයෙක් මැවිණ; ඒ තිලකාභරණයෙන් අභිනව බාලාර්ක මණ්ඩලය සේ රශ්මි සමූහයෝ නික්මෙති.

(i) මෑණියන් දියණියන්ට දෝෂාරෝපණය කළ හේතුව කුමක් ද?

(ii) දියණියන් චණ්ඩාල කුලයෙහි ඉපදීමට හේතු වූ අකුශලය දක්වන්න.

(iii) "අභිනව බාලාර්ක මණ්ඩලය සේ" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**සියලඟින්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(උ)

සු ව ඳ කුසුම් වරලසෙ හී
පැ ල ඳ කපුරු හර උරෙ හී
නොමඳ බරණ ලා සැර හී
නි බ ඳ කෙළිති ලියො පුරෙ හී

ප සු ක ර රුසිරෙන් සුර ඕා
ගොස කර රන්මිණි සල ඕා
එ නු ව ර කෙළි රඟ පුර ඕා
බ ඹ ස ර සිත වත් කල ඕා

(i) ස්ත්‍රීන් අලංකාර කර ගත් ශරීරාංග **දෙක** කවරේ ද?

(ii) බඹසර සිත කැලඹීමට හේතු වූ කාරණය කුමක් ද?

(iii) "ප සු ක ර රුසිරෙන් සුර ඕා
ගොස කර රන්මිණි සල ඕා"
මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**නොමඳ බරණ**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

● (ඳ) සහ (එ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(ඳ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "උන්ට පිදේනියක් දෙන්ට නැති හෙයින් මුසුප්පුයෙමි"

(ii) "වඩු රියන් උස කැකුළු ඇති මහරන්තලියකින් බත් උපදින්නේය"

(iii) "සොඳුර, තොප ඉණ තුබූ ඉණකඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දී ලන්න"

(iv) "එම්බා නැඟණියෙනි, මේ අනුන් සන්තක වස්තුවෙහි වරදවා පිළිපදනේය"

(v) "ඒත් ඒක මහ විපත්තියක් නේ! නන්නාඳුනන රටක නන්නාඳුනන මිනිස්සුත් එක්ක ඉන්න එක"

(vi) "උසුළු විසුළු නොකරනු මැන
පෙම්බර මා සමිඳාණෙනි"

(vii) "වතුර පැහෙනවා. තේ කෝප්පයක් වක්කරන්ඩ ද? කෝපි කෝප්පයක් හදන්ඩ ද?"

(ලකුණු 03 × 4 = 12 යි.)

(එ) කොළඹ කවි මඟ අනුගමනය කළ ද ස්වකීය ප්‍රතිභාපූර්ණ කවිත්වය ඉස්මතු කොට දැක්වීමට කවියා දැරූ උත්සාහය විමර්ශනයට ලක් කරමින් පහත දැක්වෙන කාව්‍ය නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**වන්නියේ සැන්දෑව**

හිරුරැස් විඩාවෙන් පීඩිත කෙසෙල් වතු
සනසා පවන නළවයි දලු රිකිලි අතු
මළහිරු කිරණ සිප ගැවුණ පරිදි ලතු
රන්වන් වුණා පළුගස්වල මහලු පොතු

මැඩියෝ අඬති පෙරළූ නව කුඹුරු මඩින්
බස්සෝ ඉගිල යති නිහඬව හිසට උඩින්
වවුලෝ පියාඹති මී ගෙඩි රැගෙන තුඩින්
ඈ කිසිවිටෙක නැති ගත්ත ද මෙවැනි හඬින්

සෙවණැලි නිදාගති ගම වටකළ බැද්දේ
උණ බට තරඟයට මෙන් එකටෙක මැද්දේ
උකුළෙහි කළය ඉඟ අත තාලෙට පැද්දේ
ඇය එනු බලා වැඩිවෙයි රළවැල සද්දේ

මඟ අස මලාමැලි යුතු තැනිතලා වල
තණගොබ සමග පොරකයි නවතලා පැල
කේතකි පඳුරු අතරින් නැඟ සළා ගෙළ
ඇය දෙස බලයි නිහඬව සුදු බලා වැළ

හැන්දෑ වලාකුළු නිල් නුබ ඔතා ගතී
වැබඩ උණ පඳුරු ඇය ගැන කතා ඇතී
රත්සර කැකුළු පෙඳ රැළි මැද ගොතා වෙතී
පොබයයි ඇගේ වත නැරඹුම පතා පෙතී

දෙ සවන අදී වැව්පිටියේ නඳ සීරු
පෙඳ රැළි පෙනේ ලෙස නිල් වරලස පීරු
දේදුනු පෑ දියේ තව පීනති සේරු
පැපත් රළ වළලු ඉන් වෙයි හුව මාරු

මංකඩ දිලේ විසිතුරු හිරු කිරණ වැනී
ඈ ඒ එළිය බී මගෙ හදවතට අනී
දියවැල් ඇගේ පය දැවටී වැළඳ ගනී
රන්වන් රිදී පෙති වතුරෙන් උඩට පනී

රැඹෝවීම මගෙ සතුටට හරස් වුණා
ඈ මා දැකීමෙන් මඳකට තිගැස් සුණා
අවිහිංසකව ඒ සමඟම හිනැස් සුණා
සතරැස පුදුම විදියට එක ඇසක් වුණා

(ලකුණු 12 යි.)

**2.** (අ) ශ්‍රාවක මනසෙහි ශ්‍රද්ධාව වර්ධනය වන ආකාරයට බණ කතා රචනා කිරීම දඹදෙණි කුරුණෑගල අවධිවල දී නව ප්‍රවණතාවක් ලෙස මතු වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

(ආ) ශ්‍රාවකයා තම ග්‍රහණයට ගැනීමට යෝග්‍ය ආකාරයෙන් අවස්ථා වර්ණනයේ දී භාෂාව භාවිත කිරීමෙහි ලා සද්ධර්මරත්නාවලී කතුවරයා දැක්වූ සාමර්ථ්‍යය මට්ටකුණ්ඩලී කථාව ආශ්‍රයෙන් විස්තර කරන්න.

**නැත හොත්**

ජාතක කතා කර්තෘවරයා ස්ත්‍රිය හෝ පුරුෂයා හෝ නො සලකා විවිධ අරමුණු ඔස්සේ ක්‍රියාත්මක වන සිතේ පැවැත්ම පාදක කොට ගෙන මනුෂ්‍ය ස්වභාවය විස්තර කරයි.
ජාතක පොතේ නියමිත කථාවස්තු ආශ්‍රයෙන් විමසන්න.

(ලකුණු 08 යි.)

**3.** සද්ධර්මාලංකාරයේ කථා වස්තුවල ඇතැම් සිදුවීම් තර්කානුකූලභාවයෙන් ඈත් වී ගියත් රසවත්භාවයෙන් පාඨකයාගේ සිත් ඇද බැඳ ගනී.
නිර්දිෂ්ට කථා වස්තු ආශ්‍රයෙන් විමසන්න.

**නැත හොත්**

පූජාවලී කතුවරයා කෘෂි කර්මාන්තය හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ව ඉදිරිපත් කරන කරුණුවලින් තත්කාලීන සමාජය නිරූපණය වන ආකාරය නියමිත කථා වස්තු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

**4.** අනායාසයෙන් කෙරෙන අවස්ථා නිරූපණයත් කථා වස්තුව වේගවත් ලෙස ගලා යන්නට සැලැස්වීමත් ගුත්තිල කාව්‍යයේ රචනෝපක්‍රම වී ඇති ආකාරය ගුත්තිල මූසිල හමුව ආශ්‍රයෙන් විමසන්න. (ලකුණු 15 යි.)

**5.** නවකතාවක පසුබිම යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් දැයි විස්තර කොට බැද්දේගම කෘතියේ පළමු වන පරිච්ඡේදය කථා විකාසනය සඳහා පසුබිම සකසන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**6.** සිංහල කෙටිකතාවේ යථාර්ථ නිරූපණය පැහැදිලි කොට 'දිසොන්චිනාහාමි' කෙටිකතාවේ ආකෘතික හා තේමාත්මක විශේෂතා විස්තර කරන්න. (ලකුණු 15 යි.)

**7.** නිදහස් කවියේ ප්‍රථම තරංගයට/අවධියට අයත් ප්‍රමුඛ කවීන් තිදෙනෙකු පිළිබඳ කෙටි හැඳින්වීමක් කර, ඔවුන්ගේ කාව්‍ය නිර්මාණවල විශේෂ ලක්ෂණ **තුනක්** නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

**නැත හොත්**

නිදහස් කවියේ ද්විතීය තරංගයේ/අවධියේ කවීන්ගේ කාව්‍යමය වාග්විලාසයේ විශේෂතා පරාක්‍රම කොඩිතුවක්කු, දයාසේන ගුණසිංහ හා නන්දන වීරසිංහ යන කවීන්ගේ නිර්මාණ ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 15 යි.)

**8.** සාම්ප්‍රදායික චින්තනයෙන් මිදී මූලාශ්‍රය ඉක්මවා යෑමට එදිරිවීර සරච්චන්ද්‍ර සමත් වූ ආකාරය පෙමතො ජායතී සොකො නාට්‍ය පෙළ ආශ්‍රයෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 15 යි.)

***